**ප්‍රශංසා එකතු සුපවත**
**2017 ඔක්තෝම්බර් මස 02 වෙනි දින සිට ඔක්තෝම්බර් 08 වෙනි දින දක්වා**
**"භාග්‍යවත් අම්මා වාගේ වෙමු"**

01. ආරම්භක ගීය - පුබුදු ගී අංක 09 "ප්‍රේමයාණෙනි සුදතුනි....."

02. ප්‍රශංසාවට යොමුව :

* ගීතාවලිය 103:8-10 යන වගන්ති ස්වල්පය භාවනාත්මකව කියවන්න. වරක් දෙවරක් කියවන්න.
* මේ ඔබට මැවුම්කාර දෙවියන් වහන්සේ දක්වන ප්‍රේමයයි. අන් කවරෙකුත් සඳහා නොව මෙය ඔබ සඳහාමය. මේ මොහොතේ සිටිනා තත්ත්වයට අවදි වන්න. ඔබ ඔබගේ ඇතුලාන්තය දකින්න. එසේම ඔබව සමිඳාණන් කරගන්නා සේක.
* අද මේ මොහොතට කැඳවීම ඒ ආදරය ඔබට ප්‍රකාශ කිරීමටයි. එය ඔබ හා සාංඝික කර ගැනීමටයි. එසේ සිදු කරනුයේ ඔබට තිබෙන ආදරය නිසාමය. මාගේ සැබෑ තත්ත්වය හමුවේ මට මාව බාර ගැනීමට නොහැකි මොහොතේ ඔබව/මාව සිටිනා තත්ත්වයෙන් බාර ගත්ත සමිඳුන්ට ප්‍රශංසා කරමු.
  පුබුදු ගී අංක 56 "මා හා සදා බැඳි ප්‍රේමයේ....." ගීයත් සමඟින් ප්‍රශංසාවට ඇතුළු වෙමු.

03. සුපුවත:

* "දේව අම්මා", "භාග්‍යවත් මාතාවන් ", "කන්‍යමරියෝත්තමිය" යන වදන් සියල්ලෙන්ම හඳුන්වා දෙන්නේ දේව මාතාවන් ගැනය. ඒ වදන් දෙසවන මත පතිතවූ සැනින් චිත්ත රූප ගත වන්නේ ඉතාම ලස්සන, නිහඬ, කිසිම කලබලකාරී තත්ත්වයෙන් තොර අති බැහැපත් තැනැත්තියකි. ඒ අප එකිනෙකා දේව අම්මා ගැන මනසට ඇතුල් කරගෙන සිටින ආකාරයයි. එය වැරදි නැත. එහෙත් දේව අම්මා අපගේ සීමිත දැක්මට කොටුකර ගනිමින් දැකිය හැකි මවක් නොවේ. භාග්‍යවත් මාතාවෝ ඒ සියල්ල පරයමින් ඉන් එහා යන පූර්ණ හිස්භාවයයි.
* දේව අම්මා දෙස බලන විට ආශාවන්ගෙන්, අයිතිවාසිකම්වලින්, ලෝක වටිනාකම්වලින්, බැඳීම්වලින් යන මේවායින් හිස්වීමට වඩා සිය ජීවිතයෙන්ද හිස්වූ තැනැත්තිය වේ. "මේ බලන්න, ඔබ පිළිසිඳ ගෙන පුතෙකු ලබන්නෙහිය. ඔවුන් වහන්සේට ජේසුස් යන නාමය තබන්න." (ශු.ලූක් 1:31) දේව පණිවුඩය රැගෙන ආ දේව දූතයා එය දැනුම් දෙන මේ මොහොත වනවිටත් එතුමිය දෙව් පුතුනට සිය කුසයේ පිළිසිඳීම ලබා දී අවසානය. ඒ වන විටත් එතුමිය අවිවාහක තරුණියෙකි. එවන් තරුණියක් ගැබ්ගැනීම ගල් ගසා මරණයට පත් කළ හැකි වරදකි. "ඔබ පැවසූ ලෙසම මට ඉටු වේවා" (ශු.ලූක් 1:38) යනුවෙන් මරණයේ තීන්දුව ලැබිය හැකි බව නොදැන නොවේ.
* දේව කැමැත්ත සිය ජීවිතයෙන්ම ඉටු කිරීමට, භාර ගැනීමට තරම් ගැඹුරු හිස්භාවයක් එතුමිය සතු වූවාය. "නිශ්චලවන්න මම දෙවියන් වහන්සේ බව දැනගන්න" (ගීතා.46:10) මේ ගීය එතුමියගේ තොල අගවූවා නිසැකය. මහත් අභ්‍යන්තරික නිහඬතාවයකින් අයිතිවාසිකම්වලින් සිය පෞද්ගලිකත්වයෙන් , ආශාවන්ගෙන්, බැඳීම්වලින් නිදහස්ව සිටින්නීය.
* දේව අම්මාගේ අභ්‍යන්තරික හිස්භාවය ඔබ දකින අයුරු කුඩා කණ්ඩායම් තුළ සාංඝික කර ගන්න.

04. අප දෙසට :

* දේව අම්මා වාගේ වීමට අපගේ ඇතුලාන්තයෙන් හිස්කළ යුතු දේ දකිමු. සැබෑ තත්ත්වය හඳුනා ගනිමු. ලෝකය අප බැඳ තබා ඇති ආකාරය හඳුනා ගනිමු.
* සැබැවින්ම හිස් භාවයෙන් යුතු අම්මාගේ ජීවිතයට මඳකට හෝ ඇතුළු වීමට අපට මේ බැඳීම් වලින් ඉවත්විය හැකිද?
* අප සිටින තත්ත්වයෙන් මිදීමට ආශාවක් ඇති කර ගනිමු. ඒ සඳහා බලය පතා යාච්ඤා කරමු. අප වාගේම අන් අයත් හිර වී සිටිය හැකි නිසා ඔවුන් වෙනුවෙන් ද මැදිහත් වෙමු.

05. අවසන් ප්‍රශංසාව - පුබුදු ගී අංක 100 "නිමල මරිය කුමරි වගේ......"

====================

**ප්‍රශංසා එකතු සුපවත**
**2017 ඔක්තෝම්බර් මස 09 වෙනි දින සිට ඔක්තෝම්බර් 15 වෙනි දින දක්වා**
**"ක්‍රිස්තුන් වහන්සේ වෙත නෙත් යොමා පියාණන් වහන්සේ**
**කෙරෙන් වූ තේජශ්‍රීය  දකිමු"**

01. ප්‍රශංසාව සඳහා :

* යාච්ඤාවේ ආරම්භයද ගමනද අවසානයද ශුද්ධාත්මයාණන් වහන්සේය. යාච්ඤාවේ ගමන තුළ සමිඳාණන්ගේ තේජශ්‍රීය දකින්නට අපව රැගෙන යන්නයි ශුද්ධාත්මයාණන් වහන්සේට අයදිමු.
* හිමිතුමන්ගෙන් එකම යැදුමක් යදිමි..... එනම් හිමිතුමන්ගේ සොබාලංකාරය නරඹන පිණිසත්, දේව මාලිගාවේ උදය භාවනා කරන පිණිසත් මා දිවි ඇති තාක් සැමදා සමිඳුන්ගේ මන්දිරයේ විසීමටය.
* පුබුදු ගී අංක 10  "ශුද්ධාත්මයාණෙනි වඩිනු මැනේ..... "

02. පසුගිය සතිය තුළ ලැබූ අත්දැකීම් සාංඝික කර ගනිමු.

* ශුද්ධාත්මයාණන්  වහන්සේ සමඟ යන මේ දිවි ගමනේ අපට  තෑගි කළ භාග්‍යවන්ත අම්මාගේ අත්දැකීම ඔබගේ / මගේ ජීවිතයට අයිති කරගත් අයුරු බෙදා ගනිමු.

03. දවසේ සුපුවත :

* සමිඳාණන් වහන්සේගේ මනුෂ්‍ය පුත්‍රභාවය දේව පුත්‍රභාවය කෙරෙහි නෙත සිත හදවත යොමු  කරන්නට, පුබුදු කැරිස්මාව තුළ අප ලබා ඇත්තේ උතුම් වූ ත්‍යාගයකි.
* ශු.ජොහාන් 17:22  අප ඒකත්වයක් වන පිණිස ඔබ මට දුන් තේජශ්‍රීය මම ඔවුන්ට දුනිමි.
* උත්ථානයේ ත්‍යාගය දිනූ අප සමිඳාණෝ මුළු විශ්වයටම සාංඝික වූ සේක.  මරණය පරාජය කොට උත්ථාන වූ සමිඳාණන් කෙරෙන් නික්ම එන තේජශ්‍රීය දකින්නට ඔවුන් වහන්සේ අප කැඳවන සේක.  ගැඹුරු එකමුතුකමේ ප්‍රේමයේ ජීවිතය තුළ මුල් සංඝයේ අත්දැකීම පහත සඳහන් ශු.ලියවිලි පාඨය කියවා මෙනෙහි කරමින් බෙදා ගනිමු.
* ක්‍රියා 2:42-47

**"ඔවුහු ප්‍රේරිතවරුන්ගේ ඉගැන්වීමෙහිද සහභාගි කමහිද නිරතව කල් ගත කළහ....."**

04. වචනයේ සේවකයා සඳහා :

* ස්වර්ගාරෝහනයෙන් පසු සමිඳාණන් වහන්සේ දුන් පොරොන්දුව ඉටු කරමින් ඔවුන් ශුද්ධාත්ම බලය ලැබූහ.  ශුද්ධාත්මයාණන් වහන්සේ කරණ කොට ගෙන ඉතිහාසය දෙබෑ කළ මහා සිද්ධියේ බලය අත්දකිමින් ඊට සාක්ෂි දැරූහ.
* ක්‍රිස්තුන් වහන්සේ සියල්ලන්ට සාංඝික වූවා සේ දේව පුත්‍රභාවයේ අති විශේෂ තෑග්ග වන සාංඝිකත්වය තුළ උත්ථානයේ බල මහිමය ද සමිඳාණන්ගේ මහිමාලංකාරය ද දුටුවෝය.
* ප්‍රශංසා එකතුව සමිඳාණන් වහන්සේගේ මහිමාලංකාරය අත්දකින උතුම් වූ පරිසරයයි. සමිඳාණන් වහන්සේගේ මන්දිරයයි.

05. අවසාන යාච්ඤාව :

* ශුද්ධාත්මයාණෝ සාංඝිකයාණෝය.  ඔවුන් වහන්සේ අපව ගැඹුරු ඒකත්වයක් කරා රැගෙන යන සේක. සාංඝිකත්වය පුත්‍රභාවයේ උරුමය වන බැවින්, ගැඹුරු සාංඝිකත්වයක් මුල් කරගෙනද අප සමිඳාණන්ගේ මහිමාලංකාරය දකින්නට ඔවුන් වහන්සේ කෙරෙහි අපගේ නෙත් සිත් හදවත් නිරතුරුවම යොමු කිරීමට අවැසි බලය පතා යාච්ඤා කරමු.

පුබුදු ගී අංක  126  " ශුද්ධාත්මයාණෙනි ශුද්ධාත්මයාණෙනි වඩිනු මැනවි ....... "

==========================

**ප්‍රශංසා එකතු සුපවත**
**2017 ඔක්තෝම්බර් මස 16 වෙනි දින සිට ඔක්තෝම්බර් 22 වෙනි දින දක්වා**
**"එන්න මා අනුගාමී වන්න"**

01. ආරම්භක ගීය : පුබුදු ගී අංක 381 (නව මුද්‍රණය) 356 (පැරණි මුද්‍රණය)
"වඩිනු මැනවි මැවුම්කරු සුදතුනි...."

02. ප්‍රශංසාවට යොමුව :

* ප්‍රශංසා ගමක් ලෙසින් සතිපතා අපි එකමුතු වන්නේ ගෙවී ගිය සතියේ අප අත්දුටු දේව ආදරය සාංඝික කර ගනිමින්, අපගේ සංඝය හා එක්ව දෙවිඳුන් පැසසීමටය. අප ආදර පියාණන් වහන්සේට ප්‍රශංසා කරමින්, මහිමයට පත් කරනු හැර අපට ඔවුන් වහන්සේ සඳහා වෙන කිසිවක් කළ නොහැක.
* ගීතා.148:11-12 **" මිහිපිට රජවරුන් හා සියලු මිනිස් වර්ගයෙනි, අධිපතිවරුනි, පොළොවේ සියලු විනිසකරුවෙනි, තරුණ - තරුණියනි, මහල්ලන් හා බාලයනි සමිඳුන් පසසන්න. "**

පුබුදු ගී අංක 55 "සමිඳුනි ලස්සන ලොව ඔබගෙයි....."

03. සුපුවත :

* **"ඔබ මාගේ ප්‍රියාදර පුත්‍රයාණෝය. මම ඔබ කෙරෙහි ප්‍රසන්නව සිටිමි."** යනුවෙන් ජෝර්දාන් නදියේදී ස්නාපනය තුළින් තමන් වහන්සේ මේ කැඳවා ගත් දේව පුතා නිරන්තරයෙන්ම සිය පියාණන් දෙසම යොමුකල දෙනෙතින් යුතුව සිය දූත කාර්යයෙහි නියැලුනු සේක. එසේ තමන් වහන්සේ ලද "ප්‍රසන්න පුත්‍රභාවය" තමන්ටම සතුවූවක් කර නොගෙන අප වෙත දානය කරනු පිණිස "එන්න මා අනුගාමී වන්න" යනුවෙන් කැඳවූයේ ඒ පුත්‍රභාවයටය.
* ක්‍රිස්තුන් වහන්සේ නිරන්තරයෙන්ම සිදුකලේ පියාණන් වහන්සේගේම ශුද්ධවූ කැමැත්තය. ඒ සඳහා සිය දෙනෙත් පියාණන් වහන්සේ වෙත යොමා සිටිමින් පියාණන් වහන්සේ කරන බවට දකින දේම තමන් වහන්සේ ද ඉටු කරන සේක. අපත් කැඳවමින් දානය කළේ ඒ ජීවිත පැවැත්මයි. **"පුත්‍රයාණන්ට කිසිවක් තනි බලයෙන් කළ නොහැකිය. ඔහුට කළ හැක්කේ පියාණන් වහන්සේ කරන බව තමන්ට පෙනෙන දෙය පමණකි. ඔවුන් වහන්සේ යම් දෙයක් කරන සේක්ද, ඒ දෙය පුත්‍රයාණෝද එසේම කරන සේක"** (ශු.ජොහාන් 5:19). එම නිසා අප ලැබ ඇත්තේ දේව සිත අප ජීවිත තුළින් ප්‍රකාශ කිරීමකි.
* සමිඳුන් අප කැඳවා ගන්නේ ඔවුන් වහන්සේ ගැන දන්නා කෙනෙක් වීමට නොවේ. ඔවුන් වහන්සේගේ ජීවිතය අපගේද ජීවිතය කර ගැනීමටයි. ඒ ක්‍රිස්තු අත්දැකීමටයි. තවත් ක්‍රිස්තුවරයෙක් වීමටයි. ඒ සඳහා තමන් වහන්සේගේ ජීවිත පැවැත්ම මෙහෙයවූ ශුද්ධාත්මයාණන් වහන්සේවම අපටද දානය කරන සේක. **"ඔවුන් වහන්සේ ද ඔබ සමඟ සදහටම සිටින පිණිස වෙන සහයදායකයෙකු දෙන සේක"** (ශු.ජොහාන් 14:16). සමිඳුන්ට ගුරුවරයාණන් වූ ශුද්ධාත්මයාණන් වහන්සේ අප සමඟය.
* ක්‍රිස්තුන් වහන්සේගේ ජීවිතයෙන් අත්දුටු ඒ දේව පුත්‍රභාවයම අපගේ පුත්‍රභාවය විය යුතුය. සමිඳුන්ට ඒ සඳහා සහය වූ ශුද්ධාත්මයාණෝම අපටත් මාර්ගදේශකයාණන් කරමින් දානය කර ඇත. ඒ ශුද්ධාත්මයාණන් වහන්සේට අප ජීවිතයේ ලබා දී ඇති තැන කුමක්ද? සත් වැදෑරුම් අවදිවීම අප අත්දකිනුයේ කෙසේද? (සාංඝික කර ගන්න)

04. අප දෙසට:

* අප ලද ඇරැයුම සමිඳු අනුගාමී වීමට නම් අප නිරන්තරයෙන් අවදිවීමකින්, සමිඳුන් වෙත නෙත් යොමා ගත කරන ජීවිත පැවැතුමත් අප සතුවේද? එවන් දැක්ම අප සතුව ඇත්තේ දුක් වේදනාවන්හි පමණක් ද?
* මේ ජීවිතයට අපව යොමු කරන, අපට උගන්වන ශුද්ධාත්මයාණන් වහන්සේට අවදිවීම කෙසේද? සත් වැදෑරුම් අවදිවීම ඔබගේ ජීවිතයට බද්ධ වී තිබේද? ඒ ගැන ආශාවක් ඇති කර ගනිමු.
* සතිය පුරා සෑම මොහොතකම අවදි වෙමින්, ගැඹුරු ආශාවකින් වරම් පතා යාච්ඤා කරමු.

05. අවසන් ප්‍රශංසාව : "පුතුනි මගේ පුතුනි මගේ පුතුනි මගේ ....."

============================

**ප්‍රශංසා එකතු සුපවත**
**2017 ඔක්තෝම්බර් මස 23 වෙනි දින සිට ඔක්තෝම්බර් 29 වෙනි දින දක්වා**
**"අබ්බා පියාණන්ගේ ශුද්ධවූ කැමැත්තට කොන්දේසි විරහිතව,**
**කිසිම සීමාවක් නැතිව අවනත වූ ක්‍රිස්තුන් වහන්සේ "**

01. ප්‍රශංසාව සඳහා යොමුව :
   * ස්වර්ගීය පියාණන් වහන්සේව පුතෙකු, දුවෙකු ලෙස පූර්ණව අත්දකින්නට ඔබට/මට කැඳවීමක් ලැබී ඇත.
   * **"මම ගැළවීමේ කුසලාන ගන්නෙමි. සමිඳුන්ගේ නාමයෙන් යාච්ඤා කරන්නෙමි."** (ගීතා.116:13)
   * ගැළවීමේ කුසලාන නම් ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ දුක් විඳීමේ හා මහිමයේ පංගුකාරයන් වීමට අපව සහභාගි කර ගැනීමයි. ඒ භාග්‍යවන්තකම මුල් කරගෙන සමිඳාණන් වහන්සේට අපගේ නමස්කාරය හා ප්‍රශංසාව පුද කරමු.
   * පුබුදු ගී අංක 140 "මිහි දෙරණේ මා අගය කොහෙන්දෝ ....."

02. පසුගිය සතියේ අත්දැකීම් බෙදා ගනිමු.
   * අප ලද පුත්‍රභාවයේ විශේෂත්වය වනුයේ සාංඝිකත්වයයි ඔබගේ / මගේ පුත්‍රභාවය දෙස බලමින් පසුගිය සතියේ අප ලද සුපුවත මුල් කරගෙන අපගේ අත්දැකීම් බෙදා ගනිමු.

03. දවසේ සුපුවත :
   * ශු.ලූක් 23:46 **"ජේසුස් වහන්සේ මහ හඬින් මොර ගසා පියාණෙනි, ඔබ හස්තයට මාගේ ආත්මය බාර දෙමියි වදාළ සේක."**
   * ඉහත සඳහන් ශු.ලියවිලි පාඨය මුල් කරගෙන ක්‍රිස්තුන් වහන්සේ කුරුස ගසේදී අබ්බා පියාණන්ගේ ශුද්ධවූ කැමැත්තට අවසාන මොහොත දක්වාම පූර්ණවම කීකරුව අවනත වූ අයුරු බෙදා ගන්න.

04. වචනයේ සේවකයා සඳහා :
   * සියල්ල නිමා වී යයි වදාරමින් පියාණන්ගේ හස්ත වලට තමන් වහන්සේගේ ආත්මය බාර දීමෙන් පුත්‍රයාණන් වහන්සේ තම පියාණන් කෙරෙහි තිබූ විශ්වාසය කෙතරම් දැයි අපට අනාවරණය කරයි.
   * සමිඳාණන්ගේ විශ්වාසයට පදනම වූයේ මහෝත්තමයාණන්ගේ ප්‍රේමයේ ස්ථිරත්වයයි.
   * ජෝර්දාන් නදියේ සිට ඔවුන් වහන්සේ කල්වාරි කඳු මුදුනට ගමන් කළේ කොන්දේසි විරහිතව සීමා වැට කඩුලු නොමැතිව මෙන්ම ඇතුලාන්ත නිදහසකින් බව මනාව අපට හෙළිදරව් වේ.
   * මහෝත්තමයාණන් අභියස පෙනී සිටි ඒ ශුද්ධවූ පැය මහිමයේ පැයයි.

05. අප දෙස :
   * එදිනෙදා ජීවිත සිද්ධීන් වලදී ශුද්ධාත්මයාණන් කරණකොට ගෙන ක්‍රිස්තුන් වහ්නසේ සමඟ ඒකාබද්ධ වෙමින් මෙසේ දේව අභිමුවෙහි ගැඹුරු අවනත භාවයකින් පෙනී සිටිමු නම් අපි දේව පුත්‍රභාවයට සාක්ෂි දරන්නෙමු.

06. අවසාන යාච්ඤාව :
   * ශුද්ධාත්මයාණෙනි දෙවියන් වහන්සේගේ පුතෙකු දුවෙකු ලෙස ඔවුන් වහන්සේගෙන් යැපෙන ජීවිතයක් ගත කරන්නටත් , ඔවුන් වහන්සේ අභියසදී සිදුවන දෙයට එහෙයි කියන්නටත් මෙසේ ශුද්ධවූ කැමැත්තට අවනත වෙන්නට අපට බලය දානය කළ මැනව.

පුබුදු ගී අංක 150 "ඔබෙන් තොරවූ මහ පොළොව පවා ......"

========================

**ප්‍රශංසා එකතු සුපවත**
**2017 ඔක්තෝම්බර් මස 30 වෙනි දින සිට නොවැම්බර් 04 වෙනි දින දක්වා**
**"පුබුදු දැක්ම පෝෂණය කරන ත්‍යාග සතර**
**දෙවිඳාණන් වෙතින් අප ලද සුවිශේෂ වූ වරමකි "**

01. ප්‍රශංසාව සඳහා යොමුව :
   * යාච්ඤාව යනු දෙවියන් වහන්සේගේ ආදරය අත්දැකීමයි. අපගේ ජීවිත සිද්ධීන් හරහා ඔවුන් වහන්සේගේ ආදරය අත්දකිමු මේ මොහොතේ.
   * ඔබට / මට ආදරය කරන්නට ඔවුන් වහන්සේට ඉඩ දෙමින් සතිය පුරා අප ලද අත්දැකීම් මුල් කරගෙන මහෝත්තම වූ දෙවියන් වහන්සේට නමස්කාර පූර්වකව තුති පැසසුම් පුද කරමු.
   * **සමිඳාන්ට තුති පුදන්න. එතුමාණෝ යහපත්ය. එතුමන්ගේ තිර පෙම සදහටම පවත්නේය.** (ගීතා.146:1)
   * පුබුදු ගී 27 "සමිඳුනි ඔබ වේ මාගේ එඬේරා....."

02. ආපසු බැලීම :
   * පසුගිය සතිය පුරා අනපේක්ෂිත ලෙස මුහුණ දෙන්නට සිදු වූ ජීවිත සිද්ධීන් මුල් කරගෙන දේව ආදරය අත්දකින්නට හැකිවීද?

   * අභිරහස්මකවූ දෙවි සමිඳාණන්ගේ සම්මුඛයේ පෙනී සිටිමින් දේව කැමැත්තට අවනත වී ඉඩ දුන් අවස්ථාවන් මෙන්ම ඊට නොහැකි වූ අවස්ථාවන් පිළිබඳවද බෙදා ගන්න.

03. දවසේ සුපුවත :
   * අපගේ පුබුදු ගමන පෝෂණය කරමින් සවිමත් කරන දෙවිඳාණෝ අපට දානය කළ තෑගි සතර පිළිබඳව මෙනෙහි කරමු. ජීවිත ගමන තුළ බෙහෙවින් ඔබට බලපෑ අත්දැකීම් බෙදා ගන්න.

      i භාග්‍යවත් අම්මාගේ අත්දැකීම
      ii ක්‍රිස්තුන් වහන්සේගේ පුත්‍රභාවයේ අත්දැකීම
      iii මගේ පුත්‍රභාවය අත්දැකීම
      iv අභිරහස්මක දේව සම්මුඛය අත්දැකීම

04. වචනයේ සේවකයා සඳහා :

**i භාග්‍යවත් අම්මාගේ අත්දැකීම**

දේව හඬට සවන් දෙන්නට, දේව ආදරය අත්දකින්නට එතුමිය තුළ වූ ගැඹුරු නිශ්චලතාවය, විවෘතභාවය, හිස්වීම මෙන්ම ඉඩදීමේ, බලාසිටීමේ අවශ්‍යතාවය අප ලද ත්‍යාගයකි.

**ii ක්‍රිස්තුන් වහන්සේගේ පුත්‍රභාවයේ අත්දැකීම**

අබ්බා පියාණන්ගේ ප්‍රේමය කෙරෙහි තිබූ ස්ථිරත්වය මෙන්ම අත්හැරීමේ හා ශුද්ධවූ කැමැත්තට පූර්ණවම ඉඩදීමේ පරමාදර්ශය අප ලද ත්‍යාගයකි.

**iii මගේ පුත්‍රභාවය අත්දැකීම**

මා අනුව එන්න - පුත්‍රභාවය අත්විඳින්න දේව රාජ්‍යය සඳහා වැය වෙන්නට, කැප වෙන්නට මෙන්ම සුබ අස්නේ සාක්ෂි කරුවෙකු වෙන්නට අප ලද කැඳවීම ත්‍යාගයකි.

**iv අභිරහස්මක දේව සම්මුඛය අත්දැකීම**

ජීවිත ගමනේ අරමුණ පියාණන්ගේ ශුද්ධවූ කැමැත්ත ඉටු කරමින් ඔවුන් වහන්සේව මහිමයට පත් කිරීමයි. දේව පුත්‍රභාවයේ උරුමය අත්විඳින්නට ලැබීම අප ලද ත්‍යාගයකි.

05. අවසාන යාච්ඤාව :

පුබුදු ගී 129 "පූර්ණයාණෙනි ඔබ දකින තුරා ......"

*********************************